සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]



ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2012 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2012 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2012

නව නිර්දේශය
புதிய பாடத்திட்டம்
New Syllabus

# සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I
# தொடர்பாடலும் ஊடகக்கற்கையும் I
# Communication and Media Studies I

29 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**

- ✳ සියලු ම ප්‍රශ්නවලට උත්තර සපයන්න.
- ✳ උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
- ✳ උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිලිමත් ව කියවන්න.
- ✳ **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.**

---

1. සන්නිවේදන ක්‍රියාවලිය යාන්ත්‍රික පදනමකින් යුක්තව විවරණය කරන ලද්දේ
   (1) විල්බර් ශ්‍රාම් විසිනි. (2) ඩේවිඩ් කේ. බර්ලෝ විසිනි.
   (3) ඔස්ගුඩ් හා ශ්‍රාම් විසිනි. (4) ෂැනන් හා වීවර් විසිනි.
   (5) හැරල්ඩ් ඩී. ලැස්වෙල් විසිනි.

2. මහදනමුත්තා පිළිබඳ ගොඩනැගී ඇති කතා වඩාත් අගය කළ හැකි වන්නේ
   (1) උපමා කතා ලෙස ය. (2) වීර කතා ලෙස ය.
   (3) ගැමි කතා ලෙස ය. (4) විකට කතා ලෙස ය.
   (5) ජන කතා ලෙස ය.

3. ආකේතිකරය යනු පණිවිඩය
   (1) ප්‍රතිග්‍රහණය කරන්නා ය. (2) සම්ප්‍රේෂණය කරන්නා ය.
   (3) අර්ථකථනය කරන්නා ය. (4) අනුමත කරන්නා ය.
   (5) ප්‍රතික්ෂේප කරන්නා ය.

4. "ජනමාධ්‍යකරුවන් දේශපාලන ක්‍රියාකාරීන් ලෙස කටයුතු කළ යුතු ය." යන අදහස අවධාරණය කරනු ලබන **සංකල්පය** නම්
   (1) සමාජ වගකීම් සංකල්පයයි. (2) සමාජ ප්‍රජාතන්ත්‍රවාදී සංකල්පයයි.
   (3) නිදහස් මතවාදී සංකල්පයයි. (4) සෝවියට් කොමියුනිස්ට් සංකල්පයයි.
   (5) අධිපතිවාදී සංකල්පයයි.

5. සන්නිවේදනය සඳහා අවශ්‍යම කොන්දේසිය වන්නේ
   (1) දෙදෙනකු සිටීම ය. (2) ප්‍රකාශ කිරීමට අදහස් තිබීම ය.
   (3) සංඥා පද්ධතියක් තිබීම ය. (4) යම් සිදුවීමක් පැවැතීම ය.
   (5) තොරතුරු පැවැතීම ය.

6. පුවත්පත් භාෂා භාවිතයේ දී **නොගැළපෙන** ලක්ෂණයක් වන්නේ
   (1) සරල භාෂා රටාවකින් රචනා වී තිබීම ය.
   (2) ගැඹුරු භාෂා රටාවකින් රචනා වී තිබීම ය.
   (3) ඉලක්ක කණ්ඩායම්වලට යෝග්‍ය පරිදි රචනා වී තිබීම ය.
   (4) සාම්ප්‍රදායික ක්‍රමවලට වඩා වෙනස්වීම ය.
   (5) ලේඛනයේ ස්වරූපය අනුව රටාව වෙනස් වීම ය.

7. "ජාතියක සංවර්ධනය සඳහා සහභාගී වීම එයින් වැළකී සිටිනවාට වඩා යහපත් ය." යන අදහස ප්‍රකාශ කරන ලද්දේ
   (1) ඩැනියෙල් ලර්නර් විසිනි. (2) එවරට් එම්. රොජර්ස් විසිනි.
   (3) විල්බර් ශ්‍රාම් විසිනි. (4) මාර්ෂල් මැක්ලුහන් විසිනි.
   (5) ලූෂන් පායි විසිනි.

8. ලේඛකයා පුවත්පතක කොටස් වශයෙන් පළකිරීමේ අපේක්ෂාවෙන් තම අතීත අත්දැකීම් ගළපමින් නවකතාවක් නිර්මාණය කිරීම තුළ ක්‍රියාත්මක වූ සන්නිවේදන වර්ගය නම් කළ හැක්කේ
   (1) අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනය ලෙස ය. (2) ජනසන්නිවේදනය ලෙස ය.
   (3) සමූහ සන්නිවේදනය ලෙස ය. (4) ලිඛිත සන්නිවේදනය ලෙස ය.
   (5) අන්තර් පුද්ගල සන්නිවේදනය ලෙස ය.

[ දෙවැනි පිටුව බලන්න.

9. ඕනෑම සන්නිවේදන අවස්ථාවක දී අවශ්‍යයෙන් ම දක්නට ලැබෙන සාධකයක් වන්නේ
(1) සැලසුම්කරණයයි.
(2) තොරතුරු හුවමාරුවයි.
(3) තොරතුරුවල නිරවද්‍යතාවයි.
(4) ග්‍රාහක ප්‍රතිපෝෂණයයි.
(5) උචිත නාලිකා භාවිතයයි.

10. තහඩු වහල සහිත ශාලාවක පැවැත්වෙමින් තිබූ දේශනය නවතා දමන්නට දේශකයාට සිදු වූයේ හදිසියේ ඇද හැලුණු වර්ෂාව නිසා වහලයෙන් මතු වූ ඝෝෂාව කටහඬ ඉක්මවා ගිය බැවිනි. මෙය
(1) අර්ථ බාධකයකි.
(2) පරිසර බාධකයකි.
(3) මාධ්‍ය බාධකයකි.
(4) අර්ථ බාධකයක් මෙන් ම මාධ්‍ය බාධකයකි.
(5) පරිසර බාධකයක් මෙන් ම මාධ්‍ය බාධකයකි.

11. "සමාජයේ සාමාජිකයකු ලෙස මිනිසා විසින් අත්පත් කරගනු ලැබූ දැනුම, විශ්වාස, කලාව, සදාචාර, නීතිය, සිරිත් සහ අනෙකුත් හැකියාවන් හා පුරුදු ඇතුළත් වූ සංකීර්ණ සමස්තය සංස්කෘතියයි." සංස්කෘතිය පිළිබඳ මෙම නිර්වචනය ඉදිරිපත් කොට ඇත්තේ
(1) රැල්ෆ් ලින්ටන් ය.
(2) වාල්ස් ඔස්ගුඩ් ය.
(3) කැස්පර් මැලිනොව්ස්කි ය.
(4) එඩ්වඩ් ටයිලර් ය.
(5) එඩ්වඩ් සැපීර් ය.

12. ගුවන්විදුලි මාධ්‍ය සතුවිය යුතු සුවිශේෂී ලක්ෂණය ලෙස සැලකිය හැක්කේ
(1) මිනිස් සිත කම්පනය කරන මාධ්‍යයක් වීම ය.
(2) සරල භාෂා රටාවකින් යුක්ත මාධ්‍යයක් වීම ය.
(3) ගෘහස්තව පරිහරණය කරන මාධ්‍යයක් වීම ය.
(4) හුදකලා බව නැති කරන මාධ්‍යයක් වීම ය.
(5) වෙළඳ ප්‍රචාරණ මාධ්‍යයක් වීම ය.

13. සන්නිවේදනයෙන් සිදු කරනු ලබන වැදගත් ම සමාජ මෙහෙවර නම්,
(1) ප්‍රජාව අතර අන්තර් සම්බන්ධතා ගොඩනැගීමයි.
(2) ග්‍රාහක ක්ෂේත්‍රය වෙත බලපෑම් කිරීමයි.
(3) අදහස් පොදු බවට පත් කිරීමේ ක්‍රියාවලියයි.
(4) විනෝදය සහ අධ්‍යාපනය ලබා දීමයි.
(5) පුළුල් ප්‍රජාවක් වෙත තොරතුරු ගෙන යෑමයි.

14. සහරා සංස්කාරකවරයකුට ලැබුණු අත් පිටපතක අක්ෂර වින්‍යාසය හා ව්‍යාකරණ දෝෂ සහිත වාක්‍ය කිහිපයක් දක්නට ලැබුණි. එහි සඳහන් ව තිබූ නිවැරදි වාක්‍යය කුමක් ද?
(1) මා ඔහු සමග කතා කරමින් වේදිකාවට ගොඩනැගුනෙමි.
(2) ඔහු ද මම ද එම සංවාදයට විරුද්ධ වූයෙමු.
(3) මිනිස්සු විසාල සංඛ්‍යාවක් එතැනට එක් විය.
(4) බුද්ධිමතුන් කවුරුන් ද යන්න ඔවුන් වටහා ගත්හ.
(5) සන්වාදයේ ප්‍රථිපල සාර්ථක නැත.

15. ජනමාධ්‍ය තොරතුරුවල දැකිය හැකි වඩාත් කැපී පෙනෙන ගුණාංගය වන්නේ
(1) දෛනිකත්වයයි.
(2) ඓතිහාසිකත්වයයි.
(3) සංකීර්ණත්වයයි.
(4) විශ්‍රාන්තිකත්වයයි.
(5) විවිධත්වයයි.

16. ව්‍යාපෘතියකට තොරතුරු ලබාගැනීමේ දී උපයෝගී කරගත හැකි ක්‍රම අතරට අයත් **නොවන්නේ**
(1) ප්‍රශ්නාවලි ක්‍රමයයි.
(2) සම්මුඛ සාකච්ඡා ක්‍රමයයි.
(3) නිරීක්ෂණ ක්‍රමයයි.
(4) සහභාගීත්ව නිරීක්ෂණ ක්‍රමයයි.
(5) ගවේෂණ ක්‍රමයයි.

17. ගුරුතුමා විදේශීය භාෂාවකින් දුන් උපදෙස් අවබෝධ කර ගැනීමට ගත් උත්සාහයේ දී ශිෂ්‍යයා තුළ සිදු වන්නේ
(1) ආකේතිකරණයයි.
(2) සන්දේශනයයි.
(3) පරිවර්තනයයි.
(4) විකේතිකරණයයි.
(5) ප්‍රතිනිර්මාණයයි.

18. වර්තමානයේ ජනමාධ්‍ය ක්ෂේත්‍රය තුළ ප්‍රවෘත්ති වාර්තාකරණයෙහි විෂමතා බෙහෙවින් දක්නට ලැබේ. ඒ අනුව ප්‍රවෘත්තියක නිරවද්‍යතාව රැඳී පවතින්නේ
(1) ප්‍රවෘත්ති සංස්කාරක සතු ප්‍රවෘත්ති තෝරාගැනීමේ දක්ෂතාව පදනම් කරගෙන ය.
(2) ප්‍රවෘත්ති සංස්කාරක සතු ඥාන ශක්තිය පදනම් කරගෙන ය.
(3) ප්‍රවෘත්ති සංස්කාරකවරයාගේ සංස්කරණ හැකියාව පදනම් කරගෙන ය.
(4) ප්‍රවෘත්ති වාර්තාකරුවා තෝරාගන්නා මූලාශ්‍ර පදනම් කරගෙන ය.
(5) ප්‍රවෘත්ති වාර්තාකරුවාගේ ලිවීමේ ශක්තිය පදනම් කරගෙන ය.

[ තුන්වෙනි පිටුව බලන්න.

19. වී අස්වනු නෙළීම සඳහා නිපදවන ලද නව යන්ත්‍රයක් ගොවි ජනතාව අතර ප්‍රචලිත කිරීම අවශ්‍ය විය. ඒ සඳහා ගොවි සංවිධානයක් විසින් දිවයිනේ වී වගා කරනු ලබන ප්‍රදේශවල නියමු ව්‍යාපෘති ගණනාවක් පවත්වන ලදී. සංවර්ධන සන්නිවේදන දෘෂ්ටිකෝණයෙන් බලන කල මෙම ක්‍රියාව සංකල්පීය ලෙස වඩාත් සමීප වන්නේ

(1) ලුෂන් පායිට ය.
(2) ඩැනියෙල් ලර්නර්ට ය.
(3) ඉතියෙල් ද සෝලා පූල්ට ය.
(4) විල්බර් ශ්‍රාම්ට ය.
(5) එවරට් එම්. රොජර්ස්ට ය.

20. කාර්යාලයේ එක් සේවකයෙක් තමා පමණක් ඇසින් දුටු සිදුවීමක් තම හිතවත් ම සගයාට පැවසීය. එහෙත් දින කිහිපයකින් එම සිදුවීම කාර්යාලයේ සියලු දෙනා අතර පැතිර තිබුණි. මේ තත්ත්වය හා වඩාත් ගැළපෙන සන්නිවේදන ස්වරූප වන්නේ

(1) වාචික හා විධිමත් සන්නිවේදනයයි.
(2) ශ්‍රව්‍ය හා දෘශ්‍ය සන්නිවේදනයයි.
(3) දෘශ්‍ය හා වාචික සන්නිවේදනයයි.
(4) දෘශ්‍ය හා විධිමත් සන්නිවේදනයයි.
(5) වාචික හා අවිධිමත් සන්නිවේදනයයි.

21. පහත සඳහන් අදහස්වලින් රූපණය සම්බන්ධව **නොගැළපෙන** අදහස කුමක් ද?

(1) රූපණය පුද්ගලබද්ධ සංසිද්ධියක් වීම
(2) රූපණය ඉබේ හුරු වන්නක් වීම
(3) රූපණය නිසා භාෂාවේ අර්ථ තහවුරු වීම
(4) රූපණය සංස්කෘතික විරෝධාකල්පයක් වීම
(5) රූපණය ඉරියව් හා හැසිරීම්වලින් බිහි වීම

22. මහජන සම්බන්ධතාව නව සන්නිවේදන විධික්‍රම භාවිත කරයි. එහි දී වඩාත් අවධානය යොමු විය හැක්කේ

(1) රූපවාහිනිය, ගුවන් විදුලිය FACEBOOK හා BLOGS කෙරෙහි ය.
(2) පෝස්ටර්, වෙබ් අඩවි, බැනර් හා Skype කෙරෙහි ය.
(3) FACEBOOK, වෙබ් අඩවි, BLOGS හා විද්‍යුත් තැපැල කෙරෙහි ය.
(4) සම්මන්ත්‍රණ, වැඩමුළු, පරිගණක ජාල හා ටෙලි සම්මන්ත්‍රණ කෙරෙහි ය.
(5) මෘදුකාංග, Twitter, බැනර් හා 3G කෙරෙහි ය.

23. "නිර්මාණාත්මක සන්නිවේදනය පෝෂණය වන්නේ විවිධ සමාජ සාධක පදනම් කරගෙන ය." එහිදී වඩාත් වැදගත් වන්නේ

(1) අධ්‍යාපනය, ආගම හා සංස්කෘතියයි.
(2) ජනශ්‍රැති, ආගම හා සංස්කෘතියයි.
(3) සදාචාරය, ආර්ථිකය හා පරිසරයයි.
(4) වෘත්තීන්, සිරිත්විරිත් හා විශ්වාසයයි.
(5) නිරීක්ෂණය, සමාජ සම්බන්ධතා හා විශ්ලේෂණයයි.

24. සංස්කෘතික සංවර්ධනයෙහි ලා විද්‍යාත්මක පදනමක් සහිත ව්‍යාපෘති ජාත්‍යන්තරව ක්‍රියාත්මක කරන ආයතනය වන්නේ

(1) ජාත්‍යන්තර ක්ෂමා ආයතනයයි.
(2) ජාත්‍යන්තර මූල්‍ය අරමුදලයි.
(3) ලෝක බැංකුවයි.
(4) ලෝක සෞඛ්‍ය සංවිධානයයි.
(5) යුනෙස්කෝ සංවිධානයයි.

25. සාම්ප්‍රදායික සමාජ සංවර්ධනයෙහි ලා සාම්ප්‍රදායික මාධ්‍ය වඩාත් වැදගත් වන්නේ, ඒවා

(1) ප්‍රායෝගික නමුත් සංකීර්ණ නොවන නිසා ය.
(2) හුරු පුරුදු සංඥා සංකේත හා සංදර්භවලින් යුක්ත වන නිසා ය.
(3) සැමවිට ම සරල සුභාවිතයකින් යුක්ත වන නිසා ය.
(4) වඩාත් නිර්මාණශීලී වන නිසා ය.
(5) ප්‍රතිපෝෂණ ක්‍රියාවලිය සහතික කරන නිසා ය.

26. ඉතිහාස කතා පුවතක් තේමා කර ගනිමින් නිපදවා තිබූ චිත්‍රපටයක් පිළිබඳ පුවත්පත් විචාර ගණනාවක් ලියැවී තිබුණි. එක් විචාරකයෙක් ප්‍රධාන වශයෙන් මතු කර තිබුණේ එහි පවත්නා සමාජ බලසම්බන්ධතා සහ පොදු සම්මුති, සම්ප්‍රදායයන් හා මානවවාදී ගුණාංගයන් ය. මේ සඳහා ඔහු භාවිත කළ මාධ්‍ය විචාර ප්‍රවේශ වන්නේ

(1) ඓතිහාසික හා සෞන්දර්යාත්මක ප්‍රවේශයයි.
(2) ඓතිහාසික හා සදාචාරාත්මක ප්‍රවේශයයි.
(3) සදාචාරාත්මක හා සෞන්දර්යාත්මක ප්‍රවේශයයි.
(4) දේශපාලනික හා සදාචාරාත්මක ප්‍රවේශයයි.
(5) සෞන්දර්යාත්මක හා දේශපාලනික ප්‍රවේශයයි.

27. මහාචාර්ය ජොහාන් ගැල්ටුන්ගේ ගැටුම් පිළිබඳ ත්‍රිකෝණයේ ප්‍රධාන අංග වන්නේ

(1) ව්‍යුහය, ආකල්ප හා චර්යාවයි.
(2) ආකල්ප, විසම්මුතිය හා චර්යාවයි.
(3) දුරවබෝධය, ආකල්ප හා චර්යාවයි.
(4) ව්‍යුහය, පාර්ශවකරුවන් හා ආකල්පයි.
(5) පාර්ශවකරුවන්, විසම්මුතිය හා ආකල්පයි.

The National e-learning Portal for The General Education

[ හතරවෙනි පිටුව බලන්න.

6528

28. ආයතනයක අභ්‍යන්තර මහජන සම්බන්ධතාව සාර්ථකව පවත්වාගෙන යෑමේ දී වඩාත් වැදගත් වන්නේ
   (1) නිවේදන, පෝස්ටර්, දැන්වීම් හා අත්පත්‍රිකා ය.
   (2) සුබසාධක සමිති, ක්‍රීඩා සමිති, වෘත්තිය සමිති හා දිරි දීමනා ය.
   (3) සාකච්ඡා, සම්මන්ත්‍රණ, සුහද හමු හා වාර්ෂික චාරිකා ය.
   (4) නිල ඇඳුම්, වැටුප් වර්ධක, සෞඛ්‍ය දීමනා හා ගමන් ගාස්තු ගෙවීම ය.
   (5) මාණ්ඩලික රැස්වීම්, තාක්ෂණික රැස්වීම්, කම්වුරු රැස්වීම් හා වැඩමුලු ය.

29. ජනශ්‍රැති අංගෝපාංග අතර ජන කවිය පිළිබඳ ව ඉදිරිපත් කොට ඇති පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් **සාවද්‍ය** ප්‍රකාශය වන්නේ, එය
   (1) තත්කාලීන සමාජ විවරණයකි.   (2) නිශ්චිත කර්තෘත්වයක් සහිත වූවකි.
   (3) සංස්කෘතික සම්ප්‍රේෂණ ක්‍රියාවලියකි.   (4) බුද්ධිමය සමාජ භාවිතයකි.
   (5) වර්තමාන ගීත සාහිත්‍යය පෝෂණය කරන්නකි.

30. ග්‍රාහක ක්ෂේත්‍රය වෙත ප්‍රවේශ වීමේ බලාපොරොත්තුවෙන් ජනමාධ්‍යයේ කාලය හෝ අවකාශය මිලදී ගන්නේ
   (1) මාධ්‍ය හිමිකරුවන් ය.   (2) මහජන සම්බන්ධතා ක්‍රියාකාරීන් ය.
   (3) ප්‍රතිරූප ගොඩනගන්නන් ය.   (4) අනුග්‍රාහක හවතුන් ය.
   (5) වෙළඳ දැන්වීම්කරුවන් ය.

31. ජනප්‍රිය සංස්කෘතිය පිළිබඳ **නොගැළපෙන** ප්‍රකාශය කුමක් ද?
   (1) ව්‍යාපාරික අවශ්‍යතා මත බිහි වේ.
   (2) ළමා හා තරුණ පිරිස් ආකර්ශනය කර ගනී.
   (3) කාලාන්තරයක් වෙනස් නොවී පවතී.
   (4) ජනමාධ්‍ය සමග සමීප සම්බන්ධතාවක් පවත්වයි.
   (5) සමාජ චර්යාවලට බලපෑම් එල්ල කරයි.

32. තොරතුරු බෙදහැරීමේ බටහිර ආධිපත්‍යය යනුවෙන් අදහස් කරනුයේ
   (1) බටහිර රටවල් පවත්වා ගෙන යනු ලබන වෙළඳ ආධිපත්‍යයයි.
   (2) සංවර්ධනය වෙමින් පවතින රටවලට සම්බාධක පැනවීමයි.
   (3) ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ තොරතුරු ව්‍යාප්ත කිරීමයි.
   (4) තොරතුරු මාධ්‍යයක් වන අන්තර්ජාලයට සීමා පැනවීමයි.
   (5) ඔවුන්ගේ අභිමතය පරිදි තොරතුරු ප්‍රවාහය හැසිරවීමයි.

33. ජනමාධ්‍ය ප්‍රවෘත්ති නිෂ්පාදන ක්‍රියාවලියෙහිලා මහජන සම්බන්ධතා ආයතනවල දයකත්වය ඉහළ යමින් පවතී. මෙම ප්‍රකාශය මගින් ගම්‍ය වන්නේ
   (1) මහජන සම්බන්ධතා ආයතන ප්‍රවෘත්ති මූලාශ්‍ර ලෙස කටයුතු කරන බවයි.
   (2) මහජන සම්බන්ධතා ආයතන ප්‍රවෘත්ති වාර්තාකරුවන් පුහුණු කරන බවයි.
   (3) ප්‍රවෘත්ති රචනයේ දී මහජන සම්බන්ධතා මූලධර්ම අනුගමනය කරන බවයි.
   (4) ජනමාධ්‍ය ප්‍රවෘත්ති අංශ ක්‍රියාකාරීත්වය සීමාවෙමින් පවතින බවයි.
   (5) ප්‍රවෘත්ති නිෂ්පාදන ක්‍රියාවලියට දැන්වීම්කරණය දයක වන බවයි.

34. මාධ්‍ය සාක්ෂරතාව
   A. ජනමාධ්‍යකරුවන් සතුවිය යුතු කුසලතාවකි.
   B. ජනමාධ්‍ය හැසිරීම පිළිබඳ අවබෝධයක් ලබා දෙන්නකි.
   C. පාසල් අධ්‍යාපන ක්‍රියාවලිය හා බද්ධ විය යුත්තකි.
   ඉහත ප්‍රකාශ අතුරෙන්
   (1) A සහ B නිවැරදි වන අතර C වැරදි වේ.
   (2) A සහ C නිවැරදි වන අතර B වැරදි වේ.
   (3) B සහ C නිවැරදි වන අතර A වැරදි වේ.
   (4) A, B සහ C යන සියල්ල නිවැරදි වේ.
   (5) A, B සහ C යන සියල්ල වැරදි වේ.

35. මාධ්‍ය විචාරකයාගේ ස්වභාවය පිළිබඳ ව මතු වූ අදහස් කිහිපයක් පහත දක්වේ.
   රාණි - විචාරකයා අනිවාර්යයෙන් ම වෘත්තිය මාධ්‍යකරුවෙක් විය යුතු ය.
   කමලා - විවිධ මාධ්‍ය විචාර න්‍යායයන් හා මතවාද පිළිබඳ අවබෝධයක් තිබිය යුතුයි.
   ගීතා - පොදු ග්‍රාහකයන්ට වඩා මාධ්‍ය සාක්ෂරතාවකින් යුත් පුද්ගලයෙක් විය යුතුයි.
   නිර්මලා - සෑම විට ම අලෙවි ප්‍රවර්ධනයට දිරි දෙන්නෙක් විය යුතුයි.
   ඉහත ප්‍රකාශ අතුරෙන් මාධ්‍ය විචාරකයා හා සම්බන්ධ ගැළපෙන ප්‍රකාශ කරන්නේ
   (1) රාණි හා කමලා ය.
   (2) කමලා හා ගීතා ය.
   (3) ගීතා හා නිර්මලා ය.
   (4) කමලා, ගීතා හා නිර්මලා ය.
   (5) රාණි, කමලා, ගීතා හා නිර්මලා යන සියල්ලන් ම ය.

[ පස්වෙනි පිටුව බලන්න.

36. පෝල් ලැසාස්ෆෙල්ඩ් ඉදිරිපත් කළ සන්නිවේදනය පිළිබඳ දෙපියවර න්‍යායයේ දී ජනමාධ්‍යවලින් ලබා දෙන තොරතුරු ඉන් අනතුරුව ගලා යන්නේ
(1) ග්‍රාහකයාගේ සිට පෙරළා මාධ්‍ය ආයතනය වෙත ය.
(2) පාලකයාගේ සිට පුරවැසියන් වෙත ය.
(3) ආකේතිකරය හරහා විකේතිකරය වෙත ය.
(4) ජනමත නායකයාගේ සිට අනුගාමිකයින් වෙත ය.
(5) නිලධාරීන් මගින් පොදු මහජනතාව වෙත ය.

37. සන්නිවේදන අවස්ථාවකදී වැදගත් විය හැකි සාධක කිහිපයක් පහත දක්වේ.
A. ප්‍රකාශ කරන ලද කරුණු
B. යටපත් කරන ලද කරුණු
C. සන්නිවේදකයාගේ නිර්වාචික හැසිරීම
D. ප්‍රකාශිත කරුණුවල පරස්පරතාව
ඉහත සාධක අතුරෙන් ක්‍රියාකාරී සහ වඩාත් හොඳ සවන්දෙන්නකුගේ අවධානය යොමු විය යුත්තේ
(1) A වෙත ය.
(2) A හා C වෙත ය.
(3) A හා D වෙත ය.
(4) A, C හා D වෙත ය.
(5) A, B, C හා D වෙත ය.

38. සන්නිවේදන ක්‍රියාවලිය තුළ පොදු සමාජ අරමුණු ආරක්ෂා කිරීමටත් සමාජ පරමාර්ථ සපුරා ගැනීමටත් රජයක් අනුගමනය කළ යුතු අවම වැදගත්කමින් යුත් ක්‍රමවේදය වන්නේ
(1) මාධ්‍ය නියාමන ක්‍රමවේදයක් ඇති කිරීමයි.
(2) මාධ්‍ය වාරණය ක්‍රියාත්මක කිරීමයි.
(3) මාධ්‍ය සංස්කෘතිය ශක්තිමත් කිරීමයි.
(4) මාධ්‍යවේදීන් පුහුණු කිරීමයි.
(5) මාධ්‍ය සාක්ෂරතාව ව්‍යාප්ත කිරීමයි.

39. මානවයා සතු සංඥා භාවිත කිරීමේ හැකියාව
(1) සමාජ උරුමයකි.
(2) ප්‍රවේණික සාධකයකි.
(3) ස්වාභාවික උරුමයකි.
(4) ජීව විද්‍යාත්මක උරුමයකි.
(5) අධි ස්වාභාවික උරුමයකි.

- අංක **40** සිට **43** තෙක් ප්‍රශ්නවලට මතු දක්වා ඇති විවිධ සන්නිවේදන අංග ඇසුරෙන් පිළිතුරු සපයන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| A | අග්‍රස්ථානය | B | බලපෑම | C | බාධක |
| D | මූලාශ්‍රය/සන්නිවේදකයා | E | ප්‍රතිපෝෂණය | F | සන්දර්භය |
| G | ට්‍රාන්ස්මීටරය/සම්ප්‍රේෂකයා | H | පණිවිඩය | I | නාලිකාව |
| J | අත්දැකීම් පසුතලය | K | ග්‍රාහකයා | L | සංඥා |

40. ඉහත කොටුවල දක්වා ඇති අංග අතුරෙන් ෂැනන් හා වීවර්ගේ සන්නිවේදනය පිළිබඳ ආකෘතියට අයත් **නොවන** අංග තුනක් වන්නේ
(1) A, B හා L ය.
(2) B, F හා J ය.
(3) C, I හා K ය.
(4) E, C හා J ය.
(5) G, H හා D ය.

41. ඉහත අංග ඇසුරෙන් හැරල්ඩ් ඩී. ලැස්වෙල්ගේ සන්නිවේදන නිර්වචනයට අනුරූප අංග අනුපිළිවෙළින්
(1) D, H, I, K හා B වේ.
(2) J, D, F, B හා K වේ.
(3) L, G, H, C හා A වේ.
(4) L, I, H, G හා C වේ.
(5) K, G, C, A හා E වේ.

42. මෙකී අංග අතුරෙන් K සිට D දක්වා H ගමන් කළේ ය'යි සිතන්න. මෙය හැඳින්විය යුතු වන්නේ
(1) A ලෙස ය.
(2) B ලෙස ය.
(3) C ලෙස ය.
(4) E ලෙස ය.
(5) L ලෙස ය.

43. ඉහත සංකේත ඇසුරෙන් ඩේවිඩ් කේ. බර්ලෝගේ සන්නිවේදන ආකෘතිය ඉදිරිපත් කළේ නම්, එය වඩාත් සමීප වන්නේ පහත දක්වෙන කිනම් වරණයට ද?
(1) A → H → B → E
(2) D → C → H → K
(3) D → H → I → K
(4) G → H → J → G
(5) L → G → H → A

44. පහත ප්‍රකාශවලින් ජනසන්නිවේදනය හා **නොගැළපෙන** ප්‍රකාශය කුමක් ද?
   (1) විශාල පිරිසක් එල්ල කරගත් සන්නිවේදන ක්‍රියාවලියකි.
   (2) ඇතැම් අවස්ථාවල දී පමණක් ආයතනගතව පවතී.
   (3) පුවත්පත, ගුවන්විදුලිය හා රූපවාහිනිය මෙන් ම නව මාධ්‍යය ද ඊට අයත් ය.
   (4) සන්නිවේදකයා හා ග්‍රාහකයා අතර සෘජු සම්බන්ධතාවක් නො පවතී.
   (5) තාක්ෂණික ක්‍රියාවලියක් හා බද්ධව පවතී.

45. ජනමාධ්‍ය තුළ පුරවැසි ජනමාධ්‍යවේදයට ඇති ඉඩකඩ පිළිබඳ පන්ති කාමරය තුළ සාකච්ඡාවක් සිදු විය.
   රනිල් - ජනමාධ්‍යකරුවන්ට වඩා පුරවැසි මාධ්‍යකරුවන්ගේ තොරතුරු විශ්වසනීයත්වයෙන් ඉහළයි.
   අනිල් - පුරවැසි මාධ්‍යකරුවා ජනමාධ්‍ය මගින් අවධානයට ලක් නොවූ කරුණු ඉස්මතු කරනවා.
   කමල් - ඒ වගේම පුරවැසි මාධ්‍යකරුවා ජනමාධ්‍ය පුහුණුවක් ලැබූ අයෙක්.
   ඉහත ප්‍රකාශවලින් පුරවැසි මාධ්‍යකරුවා හා ගැළපෙන ප්‍රකාශ ඉදිරිපත් කරනු ලබන්නේ
   (1) රනිල් පමණි.   (2) අනිල් පමණි.
   (3) කමල් පමණි.   (4) රනිල් හා අනිල් පමණි.
   (5) රනිල්, අනිල් හා කමල් යන තිදෙනා ම ය.

46. ලෝකයේ සංවර්ධනය වෙමින් පවතින රටවල සුබවාදී ප්‍රබල සිදුවීම් ජාත්‍යන්තර ජනමාධ්‍ය වාර්තා කරනුයේ ඊට අඩු අවධානයක් යොමු කරමිනි. මෙවැනි තත්ත්වයක් වඩාත් හොඳින් පැහැදිලි කරගත හැක්කේ
   (1) දෙපියවර සංකල්පයෙනි.   (2) සංවර්ධනාත්මක සංකල්පයෙනි.
   (3) ප්‍රජාතන්ත්‍රවාදී සංකල්පයෙනි.   (4) දොරටුපාල සංකල්පයෙනි.
   (5) ගෝලීයකරණ සංකල්පයෙනි.

47. "මට ලොකු විශ්වාසයක් තිබුණා මගේ දක්ෂතා ගැන. කවදා නමුත් මේ තරහ ඉසව්වෙන් ශ්‍රී ලංකා වාර්තාවක් තැබීමට මට පුළුවන් බව මගේ යහළුවන් ද නිතර ප්‍රකාශ කළා. අද ඒ හීනය සැබෑවුණු දවස" රවි පැවසුවේ තරමක ආඩම්බරයෙනි. මෙම ප්‍රකාශයෙන් වඩාත් පිළිබිඹු වන්නේ ඔහුගේ
   (1) අත්දැකීම් පසුතලයේ ස්වභාවයයි.   (2) සහානුභූති කුසලතාවයි.
   (3) ස්ව-සංකල්පය පිළිබඳ වූ හැඟීමයි.   (4) අන්තර්වර්ති පුද්ගල සන්නිවේදන හැකියාවයි.
   (5) ස්වදේශිකත්ව සන්නිවේදන අන්තර්ඥානයයි.

48. පුද්ගල කුසලතා කිහිපයක් පහත දැක්වේ.
   A. පරිහරණය කිරීමේ කුසලතාව
   B. විශ්ලේෂණය කිරීමේ කුසලතාව
   C. ඇගයීමේ කුසලතාව
   D. නිර්මාණය කිරීමේ කුසලතාව
   E. තුලනාත්මක කුසලතාව
   මේවා අතුරෙන් මාධ්‍ය සාක්ෂරතාව හා සම්බන්ධ වන්නේ
   (1) A, B, C හා D ය.   (2) A, B, C හා E ය.
   (3) A, B, D හා E ය.   (4) B, C, D හා E ය.
   (5) A, B, C, D හා E යන සියල්ල ම ය.

49. ජනප්‍රිය සංස්කෘතිය පිළිබඳ ශිෂ්‍යයන් අතර ඇති වූ සංවාදයකදී ඉදිරිපත් වූ අදහස් කිහිපයක් පහත දැක්වේ.
   A. වාණිජමය නිෂ්පාදනයක් බව ය.
   B. බොහෝවිට තාක්ෂණය හා බැඳී පවතින්නක් බව ය.
   C. පහසුවෙන් පරිභෝජනය කළ හැකි බව ය.
   D. පූර්ණ කලාත්මක ස්වරූපයකින් යුක්ත බව ය.
   E. ගතික ලක්ෂණවලින් සමන්විත බව ය.
   ඒ අතුරෙන් ජනප්‍රිය සංස්කෘතිය හා වඩාත් ගැළපෙන්නේ,
   (1) A, B, C හා D ය.   (2) A, B, C හා E ය.
   (3) A, B, D හා E ය.   (4) B, C, D හා E ය.
   (5) A, B, C, D හා E යන සියල්ල ම ය.

50. සන්නිවේදන ක්‍රියාවලියේ දී උද්ගත විය හැකි සීමා ලෙස සිසුවෙක් ඉදිරිපත් කර තිබූ කරුණු පහත දැක්වේ.
   A. දුර්වල පණිවිඩ සම්ප්‍රේෂණය
   B. පූර්ව විනිශ්චය
   C. දුර්වල පණිවිඩ ව්‍යූහය
   D. අර්ථමය අපැහැදිලිතාව
   ඉහත කරුණු අතුරෙන් සන්නිවේදක කේන්ද්‍රීය සීමා (Sender-Oriented Barriers) වන්නේ
   (1) A හා B පමණි.   (2) A හා C පමණි.
   (3) A හා D පමණි.   (4) A, C හා D පමණි.
   (5) A, B, C හා D යන සියල්ල වේ.

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

6527



ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2012 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2012 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2012

නව නිර්දේශය
புதிய பாடத்திட்டம்
New Syllabus

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය II
தொடர்பாடல் ஊடகக்கற்கை II
Communication and Media Studies II

29 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

උපදෙස් :

* ප්‍රශ්න **පහකට පමණක්** පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයකට හිමි ලකුණු සංඛ්‍යාව **20**කි.

1. පෞද්ගලික සමාගමක රැකියාවක් සඳහා සම්මුඛ සාකච්ඡාවකට පෙනී සිටි සීතාට ඇය ඒ සඳහා තෝරා ගත් බව ලිපියකින් දනුම් දී තිබුණි. එහි වැඩිදුරටත් සඳහන් කර තිබුණේ සේවක පිරිස අතර ගැටුම් ඇති කර නොගෙන එක් පවුලක් මෙන් සහයෝගයෙන් කටයුතු කළ යුතු බවයි.
   (i) ඉහත විස්තරයේ සඳහන් සන්නිවේදන ස්වරූප **දෙකක්** නම් කර, අදාළ අවස්ථා මොනවා දැයි දක්වන්න.
   (ii) ඉහත විස්තරයේ සඳහන් **නොවන** සන්නිවේදන වර්ග **දෙකක්** නම් කර, ඒ එක් එක් සන්නිවේදන වර්ගයේ සුවිශේෂතා **දෙක** බැගින් දක්වන්න.
   (iii) තම සේවා කටයුතුවල දී සීතාට භාවිත කළ හැකි නිර්වාචික සන්නිවේදන විධි ක්‍රම **හයක්** කෙටියෙන් විස්තර කරන්න.
   (iv) සීතාගේ රැකියා පරිසරය තුළ
      (අ) ගැටුම් උත්පාදනය වීමට බලපෑ හැකි සාධක **දෙකක්** හා
      (ආ) ගැටුම් කළමනාකරණය කිරීමේ දී උපයෝගී කරගත හැකි මාර්ගෝපදේශ **දෙකක්**
   සවිස්තරව දක්වන්න.

2. ජනමාධ්‍යයන්හි භාෂා භාවිතය පිළිබඳ විවිධ අදහස් විද්වත්හු ඉදිරිපත් කරති.
   (i) මුද්‍රිත මාධ්‍ය සඳහා භාෂා භාවිතයේ දී සැලකිලිමත් විය යුතු කරුණු **හතරක්** නම් කරන්න.
   (ii) මාධ්‍ය නිවේදනයක් සකස් කිරීමේ දී අවධානයට ගත යුතු කරුණු **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න.
   (iii) ගුවන්විදුලි මාධ්‍ය සඳහා භාෂාව යොද ගැනීමේ දී අවධානයට ගත යුතු මූලික කරුණු **තුනක්** පැහැදිලි කරන්න.
   (iv) "මාධ්‍ය දූෂණීකරණය හා සමාජ බලපෑම" යන මාතෘකාව යටතේ කරුණු **හතරක්** පදනම් කරගෙන සඟරාවකට කෙටි ලිපියක් ලියන්න.

3. පිළිගත් රක්ෂණ ආයතනයක මහජන සම්බන්ධතා නිලධාරී තනතුරට ඔබ පත් කර ඇතැ'යි උපකල්පනය කරන්න.
   (i) ආයතනයේ අභ්‍යන්තර මහජන සම්බන්ධතාව වර්ධනය කිරීම සඳහා ඔබ අනුගමනය කරන පියවර **හතරක්** නම් කරන්න.
   (ii) රක්ෂණ සමාගමේ දැන්වීමක් රූපවාහිනී මාධ්‍යයෙන් ඉදිරිපත් කිරීමට තීරණය කරන ලදී. එවැනි දැන්වීමක් නිර්මාණය කිරීමේ දී අවධානය යොමු කළ යුතු රූපවාහිනී මාධ්‍යය හා සම්බන්ධ සාධක **හතරක්** කෙටියෙන් විස්තර කරන්න.
   (iii) ආයතනයේ මහජන සම්බන්ධතාව සඳහා ඔබ අනුගමනය කරන නව මාධ්‍ය (New Media) ක්‍රමෝපායයන් **තුනක්** කෙටියෙන් විස්තර කරන්න.
   (iv) ඔබ ආයතනය මූල්‍යමය අර්බුදයකට ලක් වූයේ නම්, ආයතනයේ කීර්ති නාමය ආරක්ෂා කර ගැනීම සඳහා ඔබ අනුගමනය කරන පියවර **හතරක්** නම් කොට, ඉන් **දෙකක්** නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

4. (i) පුරවැසි ජනමාධ්‍යවේදයෙහි විශේෂතා **හතරක්** නම් කරන්න.
   (ii) විකල්ප මාධ්‍ය ලක්ෂණ **හතරක්** දක්වා, ඉන් **දෙකක්** ගැන කෙටියෙන් පහදන්න.
   (iii) මාධ්‍ය සංස්කෘතිය හේතු කොටගෙන සමාජයේ ඇතිවිය හැකි වෙනස්කම් **හතරක්** නම් කොට, ඉන් **දෙකක්** විස්තර කරන්න.
   (iv) ගෝලීයකරණයේ ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ජනසන්නිවේදන ක්ෂේත්‍රය තුළ සිදු වී ඇති ප්‍රධාන වෙනස්කම් **හතරක්** පදනම් කරගෙන රචනාවක් ලියන්න.

[ දෙවෙනි පිටුව බලන්න.

5. සංවර්ධන සන්නිවේදන ව්‍යාපෘතියක් සඳහා පන්තියේ දී ඔබගේ කණ්ඩායමට ලැබී තිබුණු මාතෘකාව වූයේ 'ශ්‍රී ලංකාවේ ජනශ්‍රැතිවල නිර්මාණාත්මක බව පිළිබඳ විචාරාත්මක අධ්‍යයනයක්' යන්නයි. එහි වාර්තාව ඉදිරිපත් කිරීමේ දී කණ්ඩායම් නායකයා වන ඔබ වෙත සෙසු කණ්ඩායම්වල සාමාජිකයින් ඉදිරිපත් කරන ලද ප්‍රශ්න හතරක් පහත දැක්වෙන අතර ඒවාට පිළිතුරු සපයන්න.
   (i) ඉහත අධ්‍යයනයේ දී අවධානය යොමු වූ ජනශ්‍රැති වර්ග **හතරක්** නම් කරන්න.
   (ii) ජනශ්‍රැති පිළිබඳ මෙකී ව්‍යාපෘති අධ්‍යයනයේ දී තොරතුරු එක් රැස් කිරීම සඳහා ඔබ උපයෝගී කරගත් විධික්‍රම **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න.
   (iii) නිර්මාණාත්මක සන්නිවේදනය සඳහා ජනශ්‍රැති යොදා ගැනීමේ වැදගත්කම කරුණු **තුනක්** ඇසුරෙන් සැකෙවින් පහදන්න.
   (iv) මෙහිදී ජනශ්‍රැති විචාරයට ලක් කිරීම සඳහා ඔබට යොදා ගත හැකි වූ මූලික විචාර ප්‍රවේශ **හතරක්** දක්වා, ඒවායේ විශේෂතා වෙන වෙන ම සාකච්ඡා කරන්න.

6. (i) සංස්කෘතිය පිළිබඳ එඩ්වඩ් ටයිලර්ගේ නිර්වචනයෙහි අන්තර්ගත ලක්ෂණ **හතරක්** නම් කරන්න.
   (ii) සන්නිවේදන කාර්යයන් **හතරක්** නම් කර, ඉන් **දෙකක්** පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.
   (iii) අව්‍යිමත් සන්නිවේදනය සතු ලක්ෂණ **තුනක්** විස්තර කරන්න.
   (iv) වර්තමාන ජනමාධ්‍ය ක්‍රියාවලිය තුළ වාරණය ක්‍රියාත්මක වන විධි **හතරක්** උදාහරණ ඇසුරින් විස්තර කරන්න.

7. යෞවන සමාජයක මාසික රැස්වීමකට සාමාජිකයෝ පැමිණ සිටිති. එහි සභාපතිවරයා මුලසුන ගත් අතර ලේකම් පසුගිය රැස්වීමේ වාර්තාව ඉදිරිපත් කළේ ය.
   (i) මෙවැනි අවස්ථා හඳුන්වන සන්නිවේදන වර්ගය කුමක් ද'යි නම් කර, එහි ලක්ෂණ **තුනක්** දක්වන්න.
   (ii) වාර්තාවට සවන් දෙමින් සිටි සාමාජිකයින්ගේ 'ශ්‍රවණ ක්‍රියාවලියේ' අවස්ථා **දෙකක්** කෙටියෙන් පැහැදිලි කරන්න.
   (iii) වාර්තාවෙන් මතු වූ කරුණු සම්බන්ධයෙන් සභාවේ යම් නොසන්සුන් බවක් ඇති විය. එය පාලනය කිරීමට සභාපතිවරයාට යොදා ගත හැකි 'ඵලදායී කථනයට' අදාළ කරුණු **තුනක්** විස්තර කරන්න.
   (iv) යෞවන සමාජය මගින් ක්‍රියාත්මක කළ ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතියක වාර්තාව ද සාමාජිකයන් වෙත ලබා දී තිබුණි. එවැනි වාර්තාවක අනිවාර්යයෙන් ම අඩංගු විය යුතු අංග **හතරක්** විස්තර කරන්න.

The National e-learning Portal for The General Education

* * *